# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## තෙවන වාර අවසාන නිපුණතා අනාවරණ පරීක්ෂණය - 2019
## පරිසරය

නම / අංකය : .................................................... 4 ශ්‍රේණිය ........ කාලය පැය 01 මිනිත්තු 15 යි.

❒ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

❖ **ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරුවලින් වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.**

01. අපි සියලුම දෙනා ආරක්ෂා කළ යුතු පොදු ස්ථානයකි.
    i. රෝහල ii. පෙළපොත් iii. දුම්රිය iv. මෝටර් රථය

02. අපගේ බාහිර පෙනුම නිවැරදිව සකස් කර ගැනීමට භාවිත කළ හැක.
    i. පොත්පත් ii. යහළුවන් iii. භාවනාව iv. කණ්ණාඩිය

03. සිත් පහන් කිරීමේ ක්‍රියාවලියේ හතරවැනි පියවර කුමක්ද?
    i. උදානය ii. ප්‍රාර්ථනාව iii. අධිෂ්ඨානය iv. මානසික ලිහිල් බව

04. රාජ්‍ය ලාංඡනයේ දක්නට නොමැති සංකේතයකි.
    i. වී කරල් ii. පළාපෙති iii. බෝපත් iv. ධර්ම චක්‍රය

05. ඉස්ලාම් ආගමික උත්සවයකි.
    i. වේල් පෙරහැර ii. පාස්කු ඉරිදා iii. දීපවාලි iv. මිලාද් උත්සවය

06. කඳෙහි මල් හටගන්නා ශාකයකි.
    i. ඇහැළ ii. සල් iii. නා iv. ඉද්ද

07. මලක ඉක්මනින්ම මැලවී මලෙන් ගිලිහී යන කොටස,
    i. නටුව ii. මනිපත්‍ර iii. රේණු iv. පෙති

08. ''ගිරෙන් ගිරට පැන ලැගුම් සොයා ........'' යන වන්නමෙන් කියවෙන සතා කවුද?
    i. වඳුරා ii. අශ්වයා iii. කුකුළා iv. අලියා

09. අප විද්‍යාලයේ නොයෙක් වර්ගවල සතුන් දැකිය හැකි ස්ථානයකි.
    i. කන්නන්ගර ශාලාව අවට ii. ක්‍රීඩාපිටිය අවට
    iii. ගොවිපොළ අවට iv. පන්ති කාමර අවට

10. පෙදරේරු, වඩු සහ ධීවර යන කර්මාන්ත සඳහා භාවිත කෙරෙන උපකරණ පිළිවෙලට දක්වා ඇති පිළිතුර,
    i. අඩු මිටිය, මනිස් ලැල්ල, විසිදැල ii. මනිස් ලැල්ල, අතකොළුව, අතංගුව
    iii. කියත, පීර, බෝලත්ත iv. වරක්කලය, මයිනහම, මට්ටම් ලීය

11. ඇසුරුම් කළ භාණ්ඩයක් මිලදී ගැනීමේ දී අඩුවෙන්ම අවධානය යොමු කළ යුතු කරුණකි.
    i. කල් ඉකුත්වීමේ දිනය ii. ප්‍රමිති සලකුණ
    iii. මිලදී ගන්නා වෙළෙඳසැල iv. නිෂ්පාදිත දිනය

12. 

රූපයේ දැක්වෙන බඳුනෙන් අමුත්තෙක් සඳහා සංග්‍රහ කිරීමට වඩා සුදුසු මින් කුමන වර්ගයද?

i. පළතුරු බීම ii. අයිස්ක්‍රීම්

iii. පළතුරු සලාද iv. තේ

13. වැලි යට දමා සහ ලුණු දැමීම යන දෙයාකාරයටම කල්තබා ගත හැකි දෙයකි.

i. මාළු ii. කොස් ඇට iii. අඹ iv. දෙහි

14. දින ගණනාවක් පුරා පවතින වැස්සත් සමග කඳුකර ප්‍රදේශවල ඇති විය හැකි අනතුරුදායක සිදුවීමකි.

i. භූමිකම්පා ii. නායයෑම iii. ගංවතුර iv. සුනාමි

15. පහත රෝග ඇසුරෙන් බෝනොවන රෝගයක් වන්නේ,

i. දියවැඩියාව ii. පැපොල iii. සරම්ප iv. අතීසාරය

16. ජලය වීදුරුවකට අයිස් කැට කිහිපයක් දැමූ විට සිදුවන දේ පිළිබඳව ගුරුතුමිය ඇසූ ප්‍රශ්නයකට ළමයින් හතර දෙනෙක් දුන් පිළිතුරු පහත දැක්වේ. මින් අසත්‍ය පිළිතුර කුමක්ද?

i. විදුරුවේ ජල පරිමාව වැඩිවේ. ii. ජලය සිසිල් වේ.

iii. ජලයේ පාට වෙනස් වේ. iv. වීදුරුව පිටත ජල වාෂ්ප තැන්පත් වී ඇත.

17. මෙම වාහන අතරින් එයට ගොඩවීමට පෙර ටිකට් පතක් ලබා ගත යුත්තේ,

i. ලංගම බස්රථය ii. ත්‍රිරෝද රථය

iii. දුම්රිය iv. පෞද්ගලික බස් රථය

18. කොම්පෝස්ට් පොහොර සාදා ගැනීමට එක් කර ගැනීමට වඩාත් සුදුසු ය.

i. අළු ii. පස් iii. පොලිතීන් iv. බොරළු

19. පාපැදියේ විශාල දැති රෝදය සහ කුඩා දැති රෝදය සම්බන්ධ කරනුයේ,

i. රෙදි පටියකින් ය. ii. යකඩ දම්වැලකින් ය.

iii. යකඩ කූරකින් ය. iv. කම්බියකින් ය.

20. ඉතා කෙටි වේලාවකින් පාසලේ සියලුම ළමයින්ට සහ ගුරුවරුන්ට පණිවුඩයක් දීමට වඩාත් සුදුසු ක්‍රමයකි.

i. දුරකතනයෙන් ii. රැස්වීමක් ගෙන

iii. දැන්වීම් පත්‍රයකින් iv. ශබ්ද විකාශන යන්ත්‍රයකින්

(ලකුණු 40)

❖ **පහත දැක්වෙන ප්‍රකාශනය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන තුළ යොදන්න.**

1) සීගිරිය ඓතිහාසික සහ කලාත්මක වටිනාකමකින් යුක්ත ස්ථානයක් ය. (    )

2) සී.ඩබ්.ඩබ්.කන්නන්ගර හෙවත් නිදහස් අධ්‍යාපනයේ පියා රිච්මන්ඩ් විද්‍යාලයේ ආදි සිසුවෙක්ය. (    )

3) අතීතයේ පණිවුඩ හුවමාරු කරගත් ක්‍රම දියුණු තත්ත්වයක පැවතුණි. (    )

4) භාණ්ඩ සහ උපකරණ නියම ස්ථානයේ තැබීමෙන් කාලය ඉතිරි කර ගත හැක. (    )

5) සුනාමිය ඇති වීමට මිනිස් ක්‍රියාකාරකම් හේතු වේ. (    )

6) අප විද්‍යාලය අයත් වන්නේ බස්නාහිර පළාතට ය. (      )

7) ලෝකයේ සෑම දරුවෙකුටම අධ්‍යාපනය ලැබීමේ අයිතියක් ඇත. (      )

8) හෝල්ඩරයකට බල්බයක් සවි කිරීමේදී ප්‍රධාන ස්විචය විසන්ධි කළ යුතුය. (      )

9) උණුවතුරෙන් තම්බා ගත් මුං බීජ හොඳින් පැළවේ. (      )

10) අපගේ ජාතික ක්‍රීඩාවේ එක් පිලකට අයත් ක්‍රීඩකයින් ගණන නවයකි. (      )

(ලකුණු 10)

❖ **පහත දැක්වෙන ඇටවුම් නම් කර එය සාදා ගැනීමට ගන්නා ද්‍රව්‍ය 02 බැගින් ලියන්න.**



ඇටවුමේ නම

.................................................................................................

1. .................................................................................................

2. .................................................................................................



ඇටවුමේ නම

.................................................................................................

1. .................................................................................................

2. .................................................................................................



ඇටවුමේ නම

.................................................................................................

1. .................................................................................................

2. .................................................................................................



ඇටවුමේ නම

.................................................................................................

1. .................................................................................................

2. .................................................................................................



ඇටවුමේ නම

.................................................................................................

1. .................................................................................................

2. .................................................................................................

(ලකුණු 15)

❖ **පහත දී ඇති විස්තර කියවා ඊට අදාළ ගැළපෙන ශ්‍රේෂ්ඨ පුද්ගලයා තෝරා ඉරකින් යා කරන්න.**

| | | |
|---|---|---|
| 1) | එංගලන්ත රාජකීය තාරකා විද්‍යාඥයින්ගේ සංගමයේ සාමාජිකයෙකි. | එස්.මහින්ද හිමි |
| 2) | භාරතයේ උපත ලැබුවා නම් දෙවියෙකු සේ සලකනු ලබයි. | ආනන්ද කුමාරස්වාමි |
| 3) | ජාතික කොඩිය සහ ජාතික ගීය සම්පාදන කමිටුවේ සාමාජිකයෙකි. | සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා |
| 4) | භාෂා කිහිපයක විශිෂ්ඨත්වයක් පෙන්වන මොහු ශ්‍රී ලංකාවේ 'කඳු හා මිනිරන්' ශාස්ත්‍රීය කෘතිය නිර්මාණය කළේය. | ටී.බී.ජයා මහතා |
| 5) | දේශාභිමානි හැඟීම් ජනිත කරවන කෘති සම්පාදන රැසක් සම්පාදනය කළේය. | ආතර් සී. ක්ලාක් මහතා |

(ලකුණු 10)

❖ **අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1) ඔබේ පාසල අයත් වන දිස්ත්‍රික්කය හා පළාත ලියන්න.

දිස්ත්‍රික්කය :- ....................................

පළාත :- ...................................

2) කාබනික පොහොර භාවිතයේ වාසි 02 ක් ලියන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

3) පොදු වාහනවල ආසන වෙන් කර ඇති පාර්ශව 02 ක් ලියන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

4) වැරදි ආහාර රටා නිසා ඇති වන රෝගාබාධ 02 ක් ලියන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

5) පන්තිකාමරයේ පිරිසිදුතාවය වැඩිදියුණු කිරීම සඳහා ඔබට කළ හැකි දේවල් 02 ක් ලියන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

6) ඇස හා කන මුල් කරගෙන තොරතුරු හුවමාරු කරගන්නා ක්‍රම 02 ක් ලියන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

7) දැති රෝද යොදා ගෙන වැඩ පහසු කරගන්නා අවස්ථා 02ක් ලියන්න.

1. ...........................................................................................................................................

2. ...........................................................................................................................................

8) පහත ජාතික සංකේත නම් කරන්න.





........................................................ ........................................................

9) අපි පෞද්ගලිකව පරිහරණය කරන භාණ්ඩ 02 ක් ලියන්න.

1. ...........................................................................................................................................

2. ...........................................................................................................................................

10) පියඹා යාම හා පිහිනීම යන ක්‍රියාකාරකම් දෙකම කළ හැකි සතුන් දෙදෙනෙක් නම් කරන්න.

1. ...........................................................................................................................................

2. ...........................................................................................................................................

(ලකුණු 20)

❖ **පහත ද්‍රව්‍ය යොදාගෙන බල්බය දැල්වෙන ආකාරය ඇඳ පෙන්වන්න.**



(ලකුණු 03)

❖ **මෙහි දැක්වෙන චුම්භකයට හා ඇල්පෙනෙති ළං කළ විට ආකර්ෂණය වන ආකාරය ඇඳ පෙන්වන්න.**




(ලකුණු 02)

❖ **හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01. ............................................... අප රටේ ඓතිහාසික ස්ථානයක් ලෙස හැඳින්විය හැකිය.

02. මින්නේරිය වැව ..................................................................................... විසින් කරවන ලද වැවකි.

03. අප අවට පරිසරය පිළිවෙළකට හා පිරිසිදුව තබා ගැනීමෙන් ..................................................... වන හානි වලක්වා ගත හැකිය.

04. අපට දිවා කාලය හා රාත්‍රී කාලය ඇති වීමට ......................................................... වටේ පෘථිවි ගෝලය කැරකීම බලපානු ලබයි.

05. ''අහසින් වැටෙන එක ජල බිඳුවක් හෝ අපතේ නොයවා ප්‍රයෝජනට ගත යුතුයි.'' යනුවෙන් පැවසූවේ ................................................................. රජතුමාය.

06. අතීතයේ මිනිස්සු වැඩ කිරීමෙන් ඇති වන වෙහෙස නිවා ගැනීමට ............................................ ..................................... ගායනා කළහ.

07. කම්බි කැපීම හා නැවීම සඳහා ............................................................... භාවිතා කරයි.

08. බීජයක් පැළවීමට ............................................................... අවශ්‍ය වේ.

09. ........................................................... අනාරක්ෂිත ස්ථානයක් ලෙස හඳුනා ගත හැකිය.

10. ........................................................... යහපුරුදු පිළිබඳ ලියවී ඇති උපදේශාත්මක ග්‍රන්ථයකි.

(මහා පරාක්‍රම බාහු රජතුමා, ඩෝසන් කුලුන, අඬුව, සර්පයන් සහිත තුඹසක්, සූර්යයා, මහසෙන් රජතුමා, ජනකවි, සිරිත් මල්දම, මැසි මදුරුවන්ගෙන්, ජලය)

(ලකුණු 10)

❖ **රාජ්‍ය ලාංඡනයේ ඊතලවලින් දැක්වෙන කොටස් නම් කරන්න.**



(ලකුණු 10)